සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

### I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශු. බයිබලය තුළ අඩංගු වන්නේ,

(1) දේව වචනයයි. (2) දස පණතයි.

(3) ලෝකය මැවීමයි. (4) නික්මයාම සිද්ධියයි.

02. ශු. බයිබලයේ නව ගිවිසුමට අයත් පොතක් වන්නේ,

(1) නික්මයාම ය. (2) ගීතාවලිය ය. (3) යෙසායා ය. (4) එළිදරව්ව ය.

03. නික්මයාම පොතෙහි ප්‍රධාන චරිතය වන්නේ,

(1) ඊසාක් ය. (2) මෝසෙස් ය. (3) ආබ්‍රහම් ය. (4) ජාකොබ් ය.

04. නව ගිවිසුමේ ඇතුළත් පළමු ග්‍රන්ථ හතර හඳුන්වනුයේ,

(1) පංච පුස්තකය නමිනි. (2) ද්විතීය සම්මත ග්‍රන්ථ නමිනි.

(3) සුබාරංචි නමිනි. (4) නීති පොත් නමිනි.

05. දේව දරුකම නමැති නොමැකෙන ලාංඡනය පුද්ගල ආත්මය තුළ සනිටුහන් කරන දේව ප්‍රසාද නිධානය වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනය ය. (2) පූජකවරය ය.

(3) දිව්‍ය සත්ප්‍රසාදය ය. (4) රෝගීන්ගේ ආලේපය ය.

06. දස පණතෙහි පස්වන දේව පණත වන්නේ,

(1) කාම මිත්‍යාචාරය නොකරව ය. (2) මව්පියන්ට සංග්‍රහ කරව ය.

(3) ජීවිත විනාශ නොකරව ය. (4) බොරු සාක්ෂි නොකියව ය.

07. පාස්කු අභිරහස ලෙස හඳුන්වන්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානයයි.

(2) ක්‍රිස්තුන් වහන්සේගේ ඉපදීම, මරණය හා උත්ථානයයි.

(3) ක්‍රිස්තුන් වහන්සේගේ ඉපදීම, පාද දෝවනය හා මරණයයි.

(4) ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උකුත්වීමයි.

08. “දූරා” නම් ස්ථානයේ රන් රූපයක් තබා එයට වන්දනා නමස්කාර කළ යුතු බවට රාජ ආඥාවක් නිකුත් කළ රජු වන්නේ,

(1) පාරාවෝ රජු ය. (2) සාවුල් රජු ය. (3) දාවිත් රජු ය. (4) නෙබුකද්නෙශර් රජු ය.

09. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන ලද්දේ,

(1) ගොබ් ඉරිදා ය. (2) මහ බ්‍රහස්පතින්දා ය.

(3) මහ සිකුරාදා ය. (4) අළු බදාදා ය.

10. ජේසුස් වහන්සේ දෙමව්පියන් සමඟ අවුරුදු පතා ජෙරුසලමට ගියේ,

(1) පාස්කු උළෙල සැමරීමට ය. (2) චර්මච්ඡේදන පිළිවෙත සිදු කිරීමට ය.

(3) පවිත්‍රවීමේ පිළිවෙත සිදු කිරීමට ය. (4) යාග පූජා ඔප්පු කිරීමට ය.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. ශු. බයිබලයේ පැරණි ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව .......................................................................................... කි.

12. ශු. ......................................................................... වෛද්‍යවරයෙක්, ඉතිහාසඥයෙක් හා චිත්‍ර ශිල්පියෙක් ලෙස ප්‍රකට සුබාරංචි කතුවරයෙකි.

13. ඉරු දිනත් ......................................................................................... ත් ශුද්ධ ලෙස ගත කරන්න.

14. රෝම අධිරාජ්‍යයේ සියළු වැසියන්ගේ සංගණනයක් ගැනීමට .......................................................... වෙතින් නියෝගයක් නිකුත් කෙරිණි.

15. ජොහාන්තුමාගේ සුබාරංචියේ සංකේතය .................................................................................................... ය.

( ණය මංගල්‍යය දින, අගොස්තුස් අධිරාජ්‍යයා, 46, ලූක්තුමා, රාජාලියා, 27 )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. ළමාවියේ ජේසුස් වහන්සේ වැඩුණු ආකාරය ශු. ලූක්තුමා තම සුබාරංචියේ සඳහන් කරයි. (   )

17. පූජකවරය සුවදානයේ දේව ප්‍රසාද නිධානයකි. (   )

18. ආරම්භක දේව ප්‍රසාද නිධාන සම්පූර්ණත්වයට පත්වන්නේ, දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමෙනි. (   )

19. අන්‍ය ආගමික වත්පිළිවෙත් සිදු කිරීම පළමු දේව පණතට විරුද්ධ පාපයකි. (   )

20. ඕනෑම අවස්ථාවක දෙවිඳුන්ගේ නාමයෙන් දිවුරීමට අපට හැකි ය. (   )

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (1) සුබාරංචි ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(2) දෙවියන් වහන්සේ තුන් වන දින මවන ලද මැවිලි දෙකක් නම් කරන්න.

(3) ආරම්භක දේව ප්‍රසාද නිධාන දෙකක් ලියන්න.

(4) ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍ය දිනයන් දෙකක් නම් කරන්න.

(5) සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන දෙකක් නම් කරන්න.

(6) ජේසුස් වහන්සේ වර්ධනය වූ ආකාර දෙකක් නම් කරන්න.

(7) දෙවියන් වහන්සේ ආදම් සහ ඒව පදිංචි කළ උයන නම් කරන්න.

(8) අප රැක ගත යුතු දේව මැවිලි දෙකක් ලියන්න.

(9) දේව මැවිල්ල පිළිබඳ කියැවෙන ගීතිකාවක් නම් කරන්න.

(10) කුඩා ධර්මදූතයෙකු ලෙස ඔබට කළ හැකි යහපත් ක්‍රියා දෙකක් නම් කරන්න. (ල. 2x10=20)

02. (1) මිනිසා අන් මැවිලිවලට වඩා උසස් වීමට හේතු දෙකක් ලියන්න. (ල. 02)

(2) දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් තුනක් ලියන්න. (ල. 03)

(3) දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ල. 05)

03. (1) දේව ප්‍රසාද නිධානයක ප්‍රධාන ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 02)

(2) එක් වරක් පමණක් ලබා ගත හැකි ප්‍රසාද නිධාන තුන නම් කරන්න. (ල. 03)

(3) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද පහක් ලියන්න. (ල. 05)

04. (1) ඉරුදින අප විශේෂයෙන් සිහිපත් කරන සිදුවීම කුමක්ද? (ල. 02)

(2) අසල්වැසියාට ප්‍රේම කිරීම සම්බන්ධව අපට උගන්වන දේව පණත් තුනක් නම් කරන්න. (ල. 03)

(3) ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ල. 05)

05. (1) ආදිපිතෘවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(2) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න. (ල. 03)

(3) උත්පත්ති පොතේ ඇතුළත් කරුණු පහක් ලියන්න. (ල. 05)

06. (1) ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ ප්‍රකාශ කළ දිව්‍යසිවරයා නම් කරන්න. (ල. 02)

(2) ජුදා ජාතිකයන්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර තුනක් නම් කරන්න. (ල. 03)

(3) දේව දරුවන් ලෙස අපට ලැබී ඇති හැකියාවන් හා දේව දීමනාවන් වෙනුවෙන් දෙවි පියාණන්ට ස්තුති කරමින් කුඩා යැදුමක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 1 ) 02. ( 4 ) 03. ( 2 ) 04. ( 3 ) 05. ( 1 ) 06. ( 3 ) 07. ( 1 ) 08. ( 4 ) 09. ( 2 ) 10. ( 1 )

11. 46 12. ලූක් තුමා 13. ණය මංගල්‍යය දින 14. අගෝස්තුස් අධිරාජ්‍යයා 15. රාජාලියා

16. (✓) 17. (X) 18. (✓) 19. (✓) 10. (X)

## II කොටස

01. (i) ♦ මතෙව් ශුභාරංචිය ♦ මාක් ශුභාරංචිය ♦ ලූක් ශුභාරංචිය ♦ ජොහාන් ශුභාරංචිය

(ii) ♦ ගොඩබිම ♦ ගස් කොළන්

(iii) ♦ ප්‍රසාද ස්නාපනය ♦ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ♦ අභිවෘද්ධි ආලේපය

(iv) 1. සෑම ඉරුදිනක් ම
2. ජනවාරි 01 - පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය
3. අගෝස්තු 15 - මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණ මංගල්‍යය
4. දෙසැම්බර් 08 - දෙව් මවුන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය
5. දෙසැම්බර් 25 - නත්තල් මංගල්‍යය

(v) ♦ පූජකවරය ♦ ආශිර්වාදකාර බන්ධනය

(vi) ♦ ප්‍රඥා මහිමයෙන් ♦ කාය ශක්තියෙන් ♦ දෙවියන්ගෙන් ප්‍රසාද ලබමින්
♦ මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින්

(vii) ඒදන් උයන

(viii) ♦ ගස්වැල් ♦ සතුන් ♦ දිය ඇළි ♦ ගංගා ආදී සියලු මැවිලිවලට ලකුණු ලබා දෙන්න.

(ix) ♦ අලුත් ඉරක් පායලා - අලුත් දිනක් උදා වෙලා.... ♦ සමිඳුන් මැව්ව දිනය අදයි....
♦ අහස පොළොව ගස්කොළන් මවා .... ආදී ගීතිකා සලකා බලන්න.

(x) ♦ වැඩිහිටියන්ට හැකි පරිදි උදව් කිරීම. ♦ යාච්ඤා කිරීම. ♦ දිව්‍ය පූජාවට සහ දහම් පාසලට සහභාගී වීම. ♦ අසරණයන් පිහිට වීම. ♦ ජේසුස් වහන්සේ පිළිබඳ අන් අයට කියා දීම වැනි පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 2x10=20)

02. (i) ♦ දේව ස්වරූපය හා සමානකම ♦ මනුෂ්‍යයා මවා ඔහුගේ නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙළීම.
♦ මිනිසා මැවූ දිනය "ඉතා" මනහර බව ප්‍රකාශ කිරීම. ♦ මිනිසා සතුන් ව නම් කිරීම. (ල. 02)

(ii) ♦ දරු සම්පත් ලැබීමට ♦ පොළොව පුරා පැතිර යාමට. ♦ මාළුන්, කුරුල්ලන්, සියලු සතුන් යනාදිය පාලනය කිරීම හෙවත් රැකබලා ගනිමින්, වර්ධනය කරමින්, මානව අවශ්‍යතා සඳහා යොදා ගැනීමට.
♦ පොළොව වගා කිරීම. ♦ වගාවෙන් ලැබෙන අස්වැන්න ප්‍රයෝජනයට ගැනීම. (ල. 03)

(iii) ♦ පරිසරය පවිත්‍රව තබා ගැනීම. ♦ ගස්වැල් සිටුවීම. ♦ පරිසරයට ආදරය කිරීම.
♦ කැලි කසල නිසි ලෙස බැහැර කිරීම ආදී පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න. (ල. 05)

03. (i) ♦ ඇතුළතින් ලබා දෙන දේව වරප්‍රසාද ලබා දීම. ♦ බාහිර ලෙස එය සලකුණු කිරීම.
♦ ක්‍රිස්තුන් වහන්සේ විසින් එය ස්ථාපිත කර තිබීම. ♦ සංඥා පිළිවෙත් අඩංගු වීම. (ල. 02)

(ii) ♦ ප්‍රසාද ස්නාපනය ♦ අභිවෘද්ධි ආලේපය ♦ පූජකවරය (ල. 03)

(iii) ♦ දේව දරුකම ♦ ශුද්ධ වූ සභාවේ සාමාජිකත්වය ♦ සුරලොවේ හිමිකරුවෙකු වීම.
♦ ජන්ම හා කර්ම පාප කමා කරනු ලැබීම. ♦ අනෙකුත් දේව ප්‍රසාද ලැබීමට සුදුසුසන් වීම. (ල. 05)

04. (i) ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසයි. (ල. 02)

(ii) දස පණතේ 4, 5, 6, 7, 8, 9, 10 යන පණත්වලින් 03 ක් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii) ♦ දිව්‍ය පූජාවට සහභාගී වීම. ♦ දහම් පාසලට සහභාගී වීම. ♦ අසරණයන්ට පිහිට වීම.
♦ රෝගීවූවන් බැලීමට යාම. ♦ විවිධ සමිති සමාගම්වලට සම්බන්ධ වීම. (ල. 05)

05. (i) ♦ ආබ්‍රහම් තුමා ♦ ඊසාක් තුමා ♦ ජාකොබ් තුමා (ල. 02)

(ii) ♦ ව්‍යවස්ථාවලිය ♦ මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව ♦ නීතිය ♦ මෝසෙස්තුමාගේ නීතිය (ල. 03)

(iii) ♦ දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම. ♦ ආදම් හා ඒව පාපයට වැටීම.
♦ කායින් හා ආබෙල්ගේ කතා පුවත ♦ නෝවා හා ජල ගැල්ම. ♦ මිනිසා ඉදිකළ බාබෙල් කොත. (ල. 05)

06. (i) යෙසායා දිවැසිවරයා (ල. 02)

(ii) ♦ අටවන දින චර්මඡේදනය කිරීම. ♦ නම් තැබීම. ♦ පිරිසිදු වීමේ පිළිවෙත් සිදු කිරීම. (ල. 03)

(iii) සිසුවා ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)